මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No: PFD/RED/REG/CIR/2023/04
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2024.05.29

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක: 01/2024

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
පළාත් පාලන ආයතන ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය බැංකු, විශ්ව විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල ප්‍රධානීන් හා
රජය සතු සමාගම්වල සභාපතිවරුන්

**1992 මුදල් රෙගුලාසි සංග්‍රහයේ සහ 2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020හි විධිවිධාන සංශෝධනය කිරීම**

**මු.රෙ. 113 - වෙනත් අත්හැර දැමීම් සහ රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් "බී" ගිණුම යටතේ ලබාදෙන ණය හා අත්තිකාරම් අත්හැර දැමීම**

## 01. පසුබිම

01. (i)හිඟ ආදායම් හා රජයට ලැබිය යුතු වෙනත් ලැබීම් (අත්තිකාරම් "බී" ගිණුමේ ණය ශේෂ ඇතුලුව) නියමිත කාලයේ දී එකතු කරගැනීම සඳහා විශේෂ විධිවිධාන යොදන බවට සහතික වීම ගණන්දීමේ නිලධාරයාගේ හා ආදායම් ගණන්දීමේ නිලධාරියාගේ වගකීමක් වන අතර ගණන්දීමේ නිලධාරින් හා ආදායම් ගණන්දීමේ නිලධාරින් මේ ආකාරයෙන් කටයුතු කරන බවට වගබලාගැනිම පිණිස විධිවිධාන සැලැස්වීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ. මු.රෙ. 124 අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි ලෙස පත් කරනු ලබන අවස්ථාවේ නිකුත් කරන ලිපියෙහිද මෙම කරුණු මැනවින් සඳහන් වේ. එබැවින්, ප්‍රධාන ගණන්දීමේ නිලධාරින්, ගණන්දීමේ නිලධාරින් හා ආදායම් ගණන්දීමේ නිලධාරින් විසින් තමන්ට පැවරී ඇති බලතල ප්‍රකාරව කටයුතු කිරීම තුළින් කඩිනම් තීරණ ගැනීමට අවස්ථාව සැලසෙන අතර මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුත්තේ තම අධිකාරි බල සීමාව තුළ එම කාර්යය ඉටුකළ නොහැකි අවස්ථාවලදී පමණි.

01. (ii) තව ද, රජයේ ආයතනවල වාර්තා වන හිඟ ආදායම් හා අත්තිකාරම් "බී" ගිණුමේ හිඟ ණය ශේෂ අයකර ගැනිම සම්බන්ධව නිසි පරිදි කටයුතු නොකිරීම පිළිබඳව පසුගිය කාල සීමාව තුළ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අවධානයට ලක්වී ඇත.

01. (iii) එබැවින්, ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන, භාණ්ඩාගාර හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව හිඟ ආදායම් හා හිඟ ණය ශේෂ සම්බන්ධයෙන් කටයුතු කළ යුතු බව අවධාරණය කෙරෙන අතර ඒ අනුව, 1992 මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 113 (3) සහ 2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020හි ඇතුළත් මු.රෙ. 113 (6) හි විධිවිධාන **2024.06.01** දින සිට බලපැවැත්වෙන ලෙස පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

**02. මු.රෙ. 113 (3) - වෙනත් අත්හැර දැමීම්**

02. (i) හැකිතාක් තාත්වික ලෙස ආදායම් ඇස්තමේන්තු සකස් කරගත යුතු අතර අදාළ වර්ෂය ඇතුළත හඳුනාගන්නා ඇස්තමේන්තු දෝෂ නිවැරදි කරගැනීමට අවශ්‍ය පියවර අදාළ වර්ෂය තුළදී ම ගත යුතු ය. තව ද, ගිණුම්කරණ දෝෂ හේතුවෙන් හිඟ ආදායමක් ලෙස ගිණුම්වල පෙන්නුම් කරන වටිනාකම් අදාළ ගිණුම් නිවැරදි කරගැනීම මගින් ගිණුම්වලින් ඉවත්කරගත යුතු ය.

02. (ii) 1992 මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 113 (3) (අ) හා (ආ) යටතේ ගැනෙන, අයකරගත නොහැකි රාජ්‍ය ආදායම හෝ රජයට ලැබිය යුතුවන වෙනත් ගාස්තු අයකර ගැනීමට සියළුම ක්‍රියාමාර්ග ගැනීමෙන් පසු එම ශේෂයන් තවදුරටත් පවත්වාගෙන යාම නිෂ්ඵල කාර්යයක් බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා සෑහීමකට පත් වන්නේ නම් පමණක් වෙන් වෙන් වශයෙන් එක් එක් කරුණක දී රු. 100,000/-ක උපරිම සීමාවක් තුළ අත්හැර දැමීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ට බලය දෙනු ලැබේ.

02. (iii) මු.රෙ. 113 (3) (ඇ) අනුව අත්හැර දැමීම සඳහා භාණ්ඩාගාරයේ ලේකම් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුත්තේ ඉහත 02 (ii) යටතේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට කටයුතු කිරීමට අධිකාර බලය නොමැති, රු. 100,000/-ක සීමාව ඉක්මවා යන අවස්ථාවන්හි දී පමණි.

**03. මු.රෙ. 113 (6) - අත්තිකාරම් "බී" ගිණුම යටතේ ලබාදෙන ණය හා අත්තිකාරම් අත්හැර දැමීම්**

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක: 01/2020 හි ඇතුළත්ව ඇති, මු.රෙ. 113 (6) හි රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ ණය ශේෂ අයකර ගැනීමට අදාළ වන විධිවිධාන පහත 113 (6) (අ) සිට (ඇ) හි දක්වා ඇති පරිදි සංශෝධනය කෙරේ.

**මු.රෙ. 113 (6)** (අ) - මෙම මුදල් රෙගුලාසිය ප්‍රකාරව ණය හෝ අත්තිකාරම් අත්හැර දැමීමට ක්‍රියා කිරීමේ දී එවැනි ණය හෝ අත්තිකාරම් ලෙස ලබා දී ඇති මුදල් අගය පොතෙන් අස්කර දැමිය හැක්කේ, එසේ අත්හැර දැමීමට නිසි අධිකාර බලය ලිඛිතව ලබා දුන් පසුව පමණි.

**මු.රෙ. 113 (6)** (ආ) - අත්තිකාරම් "බී" ගිණුම යටතේ ලබාදුන් ණය හෝ අත්තිකාරම් මුදල්වලින් පාඩු සිදුවීමක් රජය අපේක්ෂා නොකරන බැවින් එම ණය හෝ අත්තිකාරම් මුදල් ආපසු අය කර ගැනීමට ගත යුතු/හැකි සියලු ක්‍රියාමාර්ග ගත යුතු ය. අත්තිකාරම් බී ගිණුම මගින් ලබා දුන් ණය හෝ අත්තිකාරම් මුදල් අයකර ගැනීමේ දී කටයුතු කළ යුතු ආකාරය, රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 මගින් හඳුන්වා දෙන ලද මු.රෙ.113 (6) හි විධිවිධාන වලට අදාළ වන මාර්ගෝපදේශ අංක 01 හි දැක්වේ. එම මාර්ගෝපදේශ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන් බාගත කළ හැකි ය.

**මු.රෙ. 113 (6)** (ඇ) - හිඟ මුදල් අයකර ගැනීමට අදාළ වන මාර්ගෝපදේශ අංක 01 හි සඳහන් පරිදි ගත හැකි **සියලු පරිපාලනමය ක්‍රියාමාර්ග ගෙන ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා <u>පෞද්ගලිකව</u> සෑහීමට පත්වීමෙන්** අනතුරුව, අන්තර්කාලීන විධිවිධාන යටතේ මෙහි අංක 04 හි දක්වා ඇති නියමයන් හා සීමාවන්ට යටත්ව කටයුතු කළ යුතු ය. ඒ අනුව, ණය හා අත්තිකාරම්

අයකර ගැනීමට ගතයුතු/ගතහැකි සියලුම පරිපාලනමය ක්‍රියාමාර්ග ගැනීමෙන් පසුව තවදුරටත් ණය අයකර ගැනීමට නොහැකි අවස්ථාවකදී, ණය හෝ අත්තිකාරම් සඳහා වලංගු ඇපකරුවන් ලබාදීම අවශ්‍ය නොවන නිලධාරීන්, ධූරය අත්හැර යාම හෝ සේවයෙන් ඉවත්ව යාමේ දී, පත්වීම් බලධරයා විසින් නිලධාරියෙකුගේ සේවය අවසන් කිරීමේ දී, සේවයෙන් පහ කිරීමේ දී, වැඩ තහනම් කිරීමේ දී හෝ නිලධාරියා මියයාමක දී මෙම අන්තර්කාලීන විධිවිධාන අදාළ කරගත යුතු ය.

04. අන්තර්කාලීන විධිවිධාන

04. (i) දැනට ගිණුම් හා පොත්පත්වලින් ඉවත් කිරීම කළ නොහැකිව පැවති, දිගු කාලයක් තිස්සේ අය නොවී පවතින ණය ශේෂ අත්හැරදැමීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා පහත සඳහන් විශේෂිත සීමාවන් යටතේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් වෙත බලය පවරනු ලැබේ. මෙම ණය ශේෂයන් නිරවුල් කිරීමට/ කපාහැරීමට/ අත්හැරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්/ ගණන්දීමේ නිලධාරීන් පෞද්ගලිකව අවධානය යොමු කළ යුතු අතර ඒ සඳහා වන නියෝගයන් ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/ අදාළ අතිරේක ලේකම්වරු/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරු හෝ වෙනත් අදාළ නිලධාරීන් වෙත ලිඛිතව ලබාදිය යුතු ය. මෙම විශේෂිත සීමාවන් **2024.12.31 දක්වා පමණක්** බලපැවැත්වෙන බැවින් ණය ශේෂ අත්හැරීමේ කටයුතු එදිනට පෙර අවසන් කිරීමට කටයුතු කළ යුතු අතර අත්හැර දමන ණය ශේෂ පිළිබඳ විස්තර **2025.01.31** දිනට පෙර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට ද පිටපතක් සහිතව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කිරීමට කටයුතු කළ යුතු ය.

**අදාළ සිදුවීම හෝ ණය අයකර ගැනීම නතර වී,**

| | |
|---|---|
| (i) අවුරුදු 5ට වඩා අඩු කාලයක් ගත වී ඇති ණය ශේෂ | එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් ණය ශේෂය 25,000/-ක් නොඉක්මවන පරිදි |
| (ii) අවුරුදු 05-10 අතර කාලයක් ගත වී ඇති ණය ශේෂ | එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් ණය ශේෂය 50,000/-ක් නොඉක්මවන පරිදි |
| (iii) අවුරුදු 10-20 අතර කාලයක් ගත වී ඇති ණය ශේෂ | එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් ණය ශේෂය 75,000/-ක් නොඉක්මවන පරිදි |
| (iv) අවුරුදු 20ට වඩා වැඩි කාලයක් ගත වී ඇති ණය ශේෂ | එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් ණය ශේෂය 100,000/-ක් නොඉක්මවන පරිදි |

04. (ii) තව ද, ඉහත 04 (i) හි සීමාවන් යටතේ කටයුතු කළ නොහැකි ණය ශේෂයක් පවතී නම්, එයට හේතු හා ණය ශේෂ අයකර ගැනීමට මෙතෙක් ගනු ලැබූ සියළු පියවරයන් නිශ්චිතව සඳහන් කරමින් ඒ සම්බන්ධයෙන් ගතහැකි ඉදිරි පියවර ගැනීම සඳහා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත **2024.09.30** දිනට පෙර දන්වා එවිය යුතු ය.

04. (iii) **2024.12.31** දින වන විට නීතිමය වශයෙන් කටයුතු කිරීමට/නඩු පැවරීමට ක්‍රියාමාර්ග ගනු ලබන හෝ නඩු පවරා ඇති හෝ ණය ශේෂයන් හැර රජයේ අත්තිකාරම් "බී" ගිණුමේ වර්ෂ 5කට වැඩි කාලයක් නිරවුල් නොවී පවතින කිසිදු ශේෂයක් ඊළඟ මුදල් වර්ෂයට ගෙනයාමෙන් වැළකීමට අවශ්‍ය සියලු පියවර ගැනීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්/ ගණන්දීමේ නිලධාරීන් වග බලා ගත යුතු ය. කෙසේ වුව ද, මේ සම්බන්ධයෙන් යම් ගැටළුවක් පවතී නම් මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමග සාකච්ඡා කර ලබාගන්නා උපදෙස් අනුව **2024.12.31** දිනට පෙර අදාළ ගැටළුව නිරාකරණය කර ගැනීමට කටයුතු කළ යුතු ය.

05. ණය ශේෂ අත්හැර දැමීම සම්බන්ධයෙන් ඉහත 04 හි සඳහන් අන්තර්කාලීන විධිවිධාන බලපැවැත්වෙන දිනය 2024.12.31 දිනෙන් අවසන් වන බැවින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 3.1 වගන්තිය යටතේ පවරා ඇති රු. **25,000/-** ක සීමාව **2025.01.01**

දින සිට නැවත බලපැවැත්වෙන අතර, එදිනට පසු හිඟ ණය ශේෂ අත්හැරීම සම්බන්ධව එම සීමාව අනුගමනය කළ යුතු ය.

06. පොදු උපදෙස්

06. (i) හිඟ ණය ශේෂ අත්හැරීම සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතියට යොමු කරන ඉල්ලීම් රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020ට සමගාමීව නිකුත් කර ඇති මාර්ගෝපදේශ අංක 01හි සඳහන් පරිදි කටයුතු සිදු කිරීමෙන් පසුව යොමු කරන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් තහවුරු කරගෙන, මහා භාණ්ඩාගාරයේ අනුමැතියට යොමු කරන ඉල්ලීමෙහි ඒ බව සඳහන් කරමින් පෞද්ගලිකව නිර්දේශ කළ යුතු බවත් අවධාරණය කෙරේ.

06. (ii) අත්හැර දැමීම් සම්බන්ධයෙන් වන පරීක්ෂණවල දී හෝ වෙනත් එවැනි කාරණයකදී හෝ නීතිමය හෝ පරිපාලනමය වශයෙන් ක්‍රියාමාර්ග ගැනීමකදී මෙම චක්‍රලේඛයේ විධිවිධාන යටතේ කටයුතු කර තිබීම බාධාවක් ලෙස නොසැලකිය යුතු ය.

**07.** රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය බැංකු, විශ්ව විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සහ රජයට අයත් සමාගම් යනාදී ආයතනවල අලාභහානි/ ලැබිය යුතු ශේෂ කපාහැරීම සම්බන්ධයෙන් වන විට එම ආයතන විසින් මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී ඇති **යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශය, මෙහෙයුම් අත්පොත හා ඊට අදාළව නිකුත් කරනු ලබන චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු ය.**

**ඒ.කේ. සෙනෙවිරත්න**
භාණ්ඩාගාරයේ ලේකම් (වැ.බ.)

පිටපත්:
01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. අමාත්‍ය මණ්ඩල ලේකම්
04. විගණකාධිපති